# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2235/45 - 2021 ජූලි මස 07 වැනි බදාදා - 2021.07.07**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිළිවෙලින් 44(1), 45(1) සහ 47(1)(අ)(ආ) ව්‍යවස්ථාවන්ට අනුකූලව, මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2020 අගෝස්තු මස 09 දිනැති අංක 2187/27 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය, වරින් වර සංශෝධනය කරන ලදුව, 2021 ජූලි මස 07 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**ගෝඨාභය රාජපක්ෂ,**
ජනාධිපති.

2021 ජූලි මස 07 වන දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ - 01.

(1) එම නිවේදනයෙහි අංක "3.0 මුදල් අමාත්‍ය" ශීර්ෂය හා ඒ යටතේ වන "01. විෂයපථය, 02. කාර්යයන් හා කර්තව්‍යයන්, 03. සුවිශේෂී ප්‍රමුඛතා සහ 04. අදාළ ආයතනික හා නෛතික රාමුව" ඉවත් කිරීමෙන්;

(2) එම නිවේදනයෙහි අංක "2.1 ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය" ශීර්ෂයට පසු පහත නව ශීර්ෂය හා ඒ යටතේ වන "01. විෂයපථය, 02. කාර්යයන් හා කර්තව්‍යයන්, 03. සුවිශේෂී ප්‍රමුඛතා සහ 03. අදාළ ආයතනික හා නෛතික රාමුව" ඇතුලත් කිරීමෙන්;

3.0 ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය

01 විෂයපථය

"සෞභාග්‍යයේ දැක්ම" ජාතික ප්‍රතිපත්තිය මත පිහිටා ආර්ථික වර්ධනය හා සමාජීය ප්‍රගතිය වේගවත් කිරීම සඳහා අදාළ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

02 කාර්යයන් හා කාර්තව්‍යයන්

1. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීම" සඳහා නියමිත නීති සහ අණපනත් වලට අනුකූලව ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය යාන්ත්‍රණය හා පෞද්ගලික අංශ යොමු කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

2. දිළිඳුකම පිටුදැකීම හා ආර්ථික පුනර්ජීවනය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය සහ දේශගුණික විපර්යාසයන්ට තිරසාර විසඳුම් සහිත හරිත සමාජ ආර්ථිකයක් බිහිකිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය සමග සියළු අමාත්‍යාංශ සම්බන්ධීකරණය කරමින් අදාළ සංවර්ධන කටයුතු මෙහෙයවීම සඳහා පහසුකම් සැලසීම.

3. ගම සමග පිළිසඳර ග්‍රාමීය සංවර්ධන ජනාධිපති කාර්ය සාධක බලකාය සමග සම්බන්ධීකරණය.

4. පාරිභෝගික ජනතාවට මෙන්ම දේශීය නිෂ්පාදන හා සැපයුම්කරුවන්ට සාධාරණ මිළගණන් යටතේ භාණ්ඩ හා සේවා ලබා ගැනීම සහතික වන පරිදි ජීවන වියදම් පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවට වරින්වර ඉල්ලීම් ඉදිරිපත්කර, ජීවන වියදම සහ භාණ්ඩ හා සේවා පාරිභෝගික ජනතාව අතර ගලායාම අධීක්ෂණය හා සමාලෝචනය කිරීම.

5. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සංවර්ධන කමිටු හා පළාත් සභා සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කරමින් ජනතා කේන්ද්‍රිය සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම.

03 සුවිශේෂී ප්‍රමුඛතා

1. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා ජාතික සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

2. ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.

3. ආර්ථික සංවර්ධනයේ දී පෞද්ගලික අංශයේ සහභාගීත්වය පහසුකරලීම සඳහා රාජ්‍ය, පෞද්ගලික හා සමූපාකාර ක්ෂේත්‍රය සම්බන්ධීකරණය.

4. ග්‍රාමීය හා ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති සහ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම.

5. යටිතල පහසුකම් සංවර්ධන, ආයෝජන ප්‍රවර්ධන, කාබනික පොහොර නිෂ්පාදනය නියාමනය ඇතුළු රජයේ ප්‍රමුඛ සංවර්ධන වැඩසටහන් අපේක්ෂිත ඉලක්ක වෙත මෙහෙයවීම සඳහා සියළු අමාත්‍යාංශ හා අදාළ අනෙකුත් ආයතන සම්බන්ධීකරණය.

6. බිම් මට්ටමෙහි සේවා සැපයුම් ජාලය ශක්තිමත් කරමින් ග්‍රාමීය හා ප්‍රාදේශීය ආර්ථිකය නගා සිටුවීම සඳහා ජාත්‍යන්තර බැංකු, අරමුදල් හා දේශීය බැංකු ඒකාබද්ධ කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

04. අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව<br>2. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව<br>3. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය<br>4. තිරසර සංවර්ධන සභාව<br>5. කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය<br>6. තක්සේරු දෙපාර්තමේන්තුව<br>7. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය<br>8. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව<br>9. සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය<br>10. රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගමය | • සංගණන ආඥා පනත (143 අධිකාරිය)<br>• ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනත (1988 අංක 53)<br>• තිරසර සංවර්ධන පනත (2017 අංක 19)<br>• ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත (1995 අංක 15)<br>• ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත (2002 අංක 35)<br>• සුභසාධක ප්‍රතිලාභ පනත (2002 අංක 24)<br>• රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගමය ආඥාපනත (1891 අංක 5)<br>• ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත (2008 අංක 14) |

(3) එම නිවේදනයේ අංක "5.1 නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍ය" ශීර්ෂය හා ඒ යටතේ වන "01. කාර්යයන් හා කර්තව්‍යයන්,02. සුවිශේෂී ප්‍රමුඛතා සහ 03. අදාළ ආයතනික හා නෛතික රාමුව" සම්බන්ධයෙන් පහත පරිදි;

5.1 නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍ය

01. කාර්යයන් හා කර්තව්‍යයන්

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "නව නගර හා සුපිරිසිඳු රටක්"ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

02. සුවිශේෂී ප්‍රමුඛතා

1. පැල්පත් හා අඩු ආදායම්ලාභීන් සඳහා අංග සම්පූර්ණ නිවාස සංකීර්ණ සංවර්ධනය මගින් නාගරික ශ්‍රම බලකාය සමාජීය වශයෙන් සවිබල ගැන්වීම
2. කොළඹ හා නාගරික තදාසන්න ප්‍රදේශවල මැදි ආදායම්ලාභීන් සඳහා නවීන පහසුකම් සහිත නිවාස සංකීර්ණ සඳහා දිගුකාලීන ණය පහසුකම් සැපයීම සම්බන්ධීකරණය
3. ගංවතුර පාලනය, නාගරික රථගාල්, සාප්පු සංකීර්ණ, ශරීර සුවතා, විනෝදාශ්වාද පහසුකම් සැපයීම
4. පැරණි මහල් නිවාස, නව මහල් නිවාස මගින් ප්‍රතිස්ථාපනය කිරීම
5. නාගරික පැල්පත්වාසීන් සඳහා නාගරික නිවාස යෝජනා ක්‍රම හරහා නවීන නිවාස ලබා දීම හා ප්‍රජා පහසුකම් ලබාදීම
6. මධ්‍යම පාන්තිකයින් ගේ නිවාස ගැටළු විසඳීම සඳහා නව නිවාස ව්‍යාපෘති හා ණය පහසුකම් සැලසීම
7. කුලී පදනම මත තාවකාලික නේවාසිකත්වයන් අපේක්ෂා කරන්නන් සඳහා සාධාරණ කුලී පදනම මත මහල් නිවාස යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම
8. නිවාස ඉදිකිරීම් ආයතන සඳහා සහනදායි මිල යටතේ ඉඩම් ලබා දීමමගින් නව නිවාස ව්‍යාපෘති සඳහා අයෝජකයන් දිරිමත් කිරීම
9. නාගරික වන උයන්, නාගරික හා අර්ධ නාගරික උද්‍යාන, ජල උද්‍යාන හා මාර්ග දෙපස හරිත මංතීරු හඳුන්වා දීම

10. නාගරික අපද්‍රව්‍ය සහ මලාපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් හඳුන්වා දීම සහ ජලය ප්‍රතිචක්‍රීකරණය සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම
11. පළාත් පාලන ආයතන කිහිපයක් ඒකාබද්ධ වන පරිදි අපද්‍රව්‍ය බැහැර කිරීමේ අංගන හා සනීපාරක්ෂක කසල රඳවනයන් ස්ථාපනය කොට අක්‍රමවත් කසල බැහැර කිරීම් වළක්වාලීමට කටයුතු සම්පාදනය කිරීම
12. රෝහල් සහ කර්මාන්ත ශාලා අපද්‍රව්‍ය තාක්ෂණික සහ විද්‍යුත් අපද්‍රව්‍ය බැහැර කිරීමට අනුගත වන පරිදි නීති ක්‍රමවේදයන් සකස් කිරීම
13. වගකීම් රහිත කසල බැහැර කිරීම් වැලැක්වීමට පියවර ගැනීම
14. සියළුම නාගරික ඉදිකිරීම් නාගරික සංවර්ධන සැලසුම්වලට අනුකූල ව සිදුකිරීම නියාමනය කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කිරීම
15. සියළු නාගරික ඉදිකිරීම්වල දී රථ වාහන නැවැත්වීමේ අංගන හා ආබාධිත අය සඳහා ප්‍රවේශ පහසුකම් ඇතිකිරීම ව්‍යාපෘතියේ මූලික කොටසක් ලෙස සැලකීම

03. අදාළ ආයතනික හා නෛතික රාමුව

| *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|
| 1. නාගරික සංවර්ධන අධිකාරිය<br>2. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය<br>3. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය (පොදු පහසුකම් මණ්ඩලය)<br>4. සෙලෙන්දිව ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් | • නාගරික සංවර්ධන අධිකාරිය පනත (1978 අංක 41)<br>• නාගරික සංවර්ධන ව්‍යාපෘතීන් (විශේෂ විධිවිධාන) පනත (1980 අංක 2)<br>• නාගරික ජනාවාස සංවර්ධන අධිකාරී පනත (2008 අංක 36)<br>• බද්ධ නිවාස අයිතිවාසිකම් පනත (1973 අංක 11)<br>• බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනත (2018 අංක 23)<br>• බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනත (1999 අංක 4)<br>• පොදු පහසුකම් මණ්ඩල පනත (1973 අංක 10) |

(4) එම නිවේදනයෙහි අංක "5.3 වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය" ශීර්ෂයට පසු පහත නව ශීර්ෂය හා ඒ යටතේ වන "01. කාර්යයන් හා කර්තව්‍යයන්, 02. සුවිශේෂී ප්‍රමුඛතා සහ 03. අදාළ ආයතනික හා නෛතික රාමුව" ඇතුලත් කිරීමෙන්;

5.4 වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය

01. කාර්යයන් හා කර්තව්‍යයන්

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "සමුද්‍රීය සම්පත් ආරක්ෂා කිරීම හා පහත්බිම් සංවර්ධනය" සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

02. සුවිශේෂී ප්‍රමුඛතා

1. සමුද්‍ර ආශ්‍රිත පරිසර දූෂණය වැළැක්වීම සඳහා සුදුසු ක්‍රියාකාරී සැලැස්මක් හඳුන්වාදීම
2. සමුද්‍ර ඛාදනය වැළැක්වීමට පියවර ගැනීම
3. ප්ලාස්ටික් අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා මුහුදු තීරයට සහ මුහුදු පත්ලට සිදු වී ඇති හානිය වළක්වා ගැනීම සඳහා සමුද්‍රුරු පවිත්‍රතා වැඩසටහන් කියාත්මක කිරීම
4. ගංවතුරෙන් තොර වාසස්ථාන ඇතිකිරීම හා පරිසරය ආරක්ෂා කිරීම අරමුණු කරගත් පහත්බිම් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

03. අදාළ ආයතනික හා නෛතික රාමුව

| දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත් |
|---|---|
| 1. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව හා එහි පාලිත සමාගම් සහ අනුබද්ධ සමාගම්<br>2. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය<br>3. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව | • ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනත (1968 අංක 15)<br>• සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනත (2008 අංක 35)<br>• වෙරළ සංරක්ෂණ පනත (1981 අංක 57) |

(5) එම නිවේදනයෙහි අංක "3.0 මුදල් අමාත්‍ය" ශීර්ෂය හා ඒ යටතේ වන "01. විෂයපථය, 02. කාර්යයන් හා කර්තව්‍යයන්, 03. සුවිශේෂී ප්‍රමුඛතා සහ 04. අදාළ ආයතනික හා නෛතික රාමුව" සම්බන්ධයෙන් පහත පරිදි;

6.0 මුදල් අමාත්‍ය

01. විෂයපථය

සාර්ව ආර්ථික ප්‍රතිපත්ති, වාර්ෂික අයවැය හා විසර්ජන පනත් සම්බන්ධ වගකීම්, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, දේශීය හා විදේශීය ඉතුරු කිරීම් හා ආයෝජන, රාජ්‍ය ණය බැංකු, මූල්‍ය හා රක්ෂණ කටයුතු ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතා, සමාජ ආරක්ෂණ සහ ආර්ථික සංවර්ධන කටයුතු මෙහෙයවීම.

02. කාර්යයන් හා කර්තව්‍යයන්

''සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක්" ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත් වලට අනුකූලව මුදල් විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය යාන්ත්‍රණය හා පෞද්ගලික අංශ යොමු කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

03. සුවිශේෂී ප්‍රමුඛතා

1. සැමට ප්‍රතිලාභ විහිදෙන, සියළු පළාත් ආවරණය වන, ආදායම් විෂමතා අවම වන, තිරසර ඉහළ ආර්ථික වර්ධන වේගයක් ඇති කර ගැනීම
2. අඩු ආදායම්ලාභීන්ට ප්‍රමුඛත්වය දෙමින් සේවා වියුක්තිය අඩුකර ගැනීම හා ඒක පුද්ගල ආදායම ඉහල නංවා ගැනීම
3. වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතය අඩු අගයක පවත්වා ගැනීම තුල මිල ස්ථාවරත්වය ඇති කිරීම
4. අයවැය හිඟය හා රාජ්‍ය ණය අඩු කර ගැනීම මගින් රාජ්‍ය ආදායම් ප්‍රතිපත්තිවල අවිනිශ්චිතතාවයන් අවම කිරීම
5. ණය පොලී අනුපාතය අඩු අගයක පවත්වා ගැනීම තුලින් මූල්‍ය සම්පත් ආර්ථික අවශ්‍යතාවන් පුළුල් කිරීම
6. රුපියලේ අගය ස්ථාවරත්වය තහවුරු වන පරිදි මූල්‍ය හා ගෙවුම් ශේෂ ප්‍රතිපත්ති හා පොලී අනුපාත ස්ථාවර කර ගැනීම
7. දේශීය නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම, අඩු ආදායම්ලාභීන් සවිබල ගැන්වීම සහ ආයෝජන දිරිගැන්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුන්වා දීම
8. පොදු ජනතාවට ප්‍රතිලාභ ලැබෙන පරිදි දේශීය ව්‍යාපාරික ප්‍රජාවට අවශ්‍ය ව්‍යාපාරික පරිසරය පුළුල් කිරීම
9. රාජ්‍ය ව්‍යවසායන් ශක්තිමත් කිරීම
10. රජයේ ආදායම් හා වියදම් කළමනාකරණය කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම

04. අදාළ ආයතනික හා නෛතික රාමුව

| *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|
| 1. භාණ්ඩාගාර කටයුතු<br><br>i. මහා භාණ්ඩාගාරය<br>ii. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව<br>iii. ජාතික අයවැය දෙපාර්තමේන්තුව<br>iv. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව<br>v. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව<br>vi. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව<br>vii. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව<br>viii. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව<br>ix. වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව<br>x. තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව<br>xi. නීති කටයුතු දෙපාර්තමේන්තුව<br>xii. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව<br>xiii. සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව<br><br>2. රාජ්‍ය ආදායම් කළමනාකරණ කටයුතු<br><br>i. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව<br>ii. ශ්‍රී ලංකා රේගුව<br>iii. සුරාබදු දෙපාර්තමේන්තුව<br>iv. ජාතික ලොතරැයි මණ්ඩලය<br>v. සංවර්ධන ලොතරැයි මණ්ඩලය<br>vi. ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව<br><br>3. බැංකු මූල්‍ය හා ප්‍රාග්ධන වෙළඳපල ප්‍රතිපත්ති හා නියාමන කටයුතු<br><br>i. ශ්‍රී ලංකා මහ බැංකුව<br>ii. සියලුම රාජ්‍ය බැංකු, මූල්‍ය, රක්ෂණ හා ඒවායේ පාලිත සමාගම් හා ආශ්‍රිත ආයතන<br>iii. ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය<br>iv. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා එහි පාලිත සමාගම් සහ අනුබද්ධ සමාගම්<br>v. ණය තොරතුරු කාර්යංශය<br>vi. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව<br>vii. ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසම<br>viii. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව<br><br>4. අරමුදල් ප්‍රතිපාදන<br><br>i. ලෝහෝර් ආර්යා අරමුදල<br>ii. වර්ජන, කෝලහාල, සිවිල් කලබල හා ත්‍රස්තවාදය පිළිබඳ අරමුදල<br>iii. ජාතික රක්ෂණ භාර අරමුදල<br>iv. සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල<br>v. ශ්‍රම වාසනා අරමුදල<br>vi. ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල | • විසර්ජන පනත්<br>• රේගු ආඥාපනත (1956 අංක 17)<br>• විදේශීය ණය පනත (1957 අංක 29)<br>• හර බදු පනත (2007 අංක 12)<br>• ඔට්ටු ඇල්ලීම් හා සූදු බදු පනත (1998 අංක 40)<br>• ආර්ථික සේවා ගාස්තු පනත (2006 අංක 13)<br>• සුරාබදු ආඥාපනත (52 වැනි අධිකාරය)<br>• මූල්‍ය කල් බදු පනත (2000 අංක 56)<br>• මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත (2006 අංක 6)<br>• රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත (2003 අංක 3)<br>• දේශීය ආදායම් පනත (2006 අංක 10)<br>• රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත (2000 අංක 43)<br>• ලෝහෝර් ආර්යා අරමුදල පනත (1951 අංක 38)<br>• දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත (1923 අංක 8)<br>• ජාතිය ගොඩනැගීමේ බදු පනත (2009 අංක 9)<br>• ව්‍යාපාර නාම පනත (1987 අංක 7)<br>• සමාගම් පනත (2007 අංක 7)<br>• වෙළඳ සළකුණු පනත (1964 අංක 30)<br>• සීට්ටු ආඥාපනත (1935 අංක 61)<br>• පොදු කොන්ත්‍රාත් පනත (1987 අංක 3)<br>• මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත (2006 අංක 5)<br>• ආනයන හා අපනයන (පාලන) පනත (1969 අංක 1)<br>• මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත (2006 අංක 12)<br>• මුද්දර ගාස්තු පනත (1982 අංක 43)<br>• එකතු කළ අගයමත බදු පනත (2002 අංක 14)<br>• මුදල් පනත (1971 අංක 38)<br>• පරිසර සංරක්ෂණ බදු පනත (2008 අංක 26)<br>• බදු අභියාචනා කොමිෂන් සභාව පනත (2008 අංක 23)<br>• සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත (1997 අංක 20)<br>• ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත (1978 අංක 15)<br>• මුදල් නීති පනත (1949 අංක 58)<br>• ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත (1971 අංක 30)<br>• මහජන බැංකු පනත (1961 අංක 29)<br>• ලංකා බැංකු ආඥාපනත (1938 අංක 53)<br>• බැංකු පනත (1988 අංක 30)<br>• බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීම් (විශේෂ විධිවිධාන) පනත 1990 අංක 4 |

| *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|
| vii. වකුගඩු අරමුදල<br>viii. තේ ශක්ති අරමුදල<br>ix. කප්රුක අරමුදල<br>x. රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල<br>xi. බුද්ධ ශාසන අරමුදල<br>xii. බෞද්ධ පුනරුද අරමුදල<br>xiii. සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල<br>xiv. දේශීය ණය සහ සංවර්ධන අරමුදල<br>xv. නිමැයුම්කරුවන්ගේ අරමුදල<br>xvi. තුරුසවිය අරමුදල<br>xvii. මධ්‍යම සංස්කෘතික අරමුදල<br><br>5. ඈවර කිරීමට හෝ වෙනත් ආයතන සමග ඒකාබද්ධ කිරීමට නියමිත ආයතන<br><br>i. විදුලි සංදේශ දෙපාර්තමේන්තුව<br>ii. වනජීවී භාරය<br>iii. ශ්‍රී ලංකා ජනමාධ්‍ය අභ්‍යාස ආයතනය<br>iv. අභ්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුව<br>v. මාශ භෝග හා ධාන්‍ය පර්යේෂණ සහ නිෂ්පාදන අධිකාරිය<br>vi. සීමාසහිත ජනතා ෆර්ටිලයිසර් එන්ටර්ප්‍රයිසස්<br>vii. දරුවන් සුරකිමු ජාතික භාර අරමුදල | • ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත (1987 අංක 36)<br>• ජාතික රක්ෂණ භාර අරමුදල් පනත (2006 අංක 28)<br>• සේවා නියුක්තයින්ගේ භාර අරමුදල (විශේෂ විධිවිධාන) පනත (1993 අංක 19)<br>• සේවා නියුක්තයින්ගේ භාර අරමුදල පනත (1980 අංක 46)<br>• නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත<br>• ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත (1937 අංක 07)<br>• ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත (2005 අංක 28)<br>• මුදල් ව්‍යාපාර පනත (2011 අංක 42)<br>• විදේශ විනිමය පනත (2017 අංක 12)<br>• රක්ෂණ සංස්ථා පනත (1961 අංක 02)<br>• ශ්‍රම වාසනා අරමුදල් පනත (1998 අංක 12)<br>• තේ ශක්ති අරමුදල පනත (2000 අංක 47)<br>• කප්රුක අරමුදල් පනත (2005 අංක 31)<br>• මධ්‍යම සංස්කෘතික අරමුදල පනත (1980 අංක 57)<br>• දේශීය ණය සහ සංවර්ධන අරමුදල පනත (1916 අංක 22)<br>• තුරුසවිය අරමුදල් පනත (2000 අංක 23)<br>• ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශ පනත (1990 අංක 18)<br>• දෘෂ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය භාර අරමුදල පනත (1992 අංක 9) |

(6) එම නිවේදනයෙහි අංක "3.1 මුදල් හා ප්‍රාග්ධන වෙළඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය සහ 3.2 සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍ය" ශීර්ෂයන්, "6.1 මුදල් හා ප්‍රාග්ධන වෙළඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය සහ 6.2 සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍ය" ලෙස නැවත අංකගත කිරීමෙන්;

(7) එම නිවේදනයෙහි අංක "6.0 අධිකරණ අමාත්‍ය" ශීර්ෂයේ සිට නැවත අංකගත කිරීමෙන්;

(8) එම නිවේදනයේ අංක "15.0 කෘෂිකර්ම අමාත්‍ය" ශීර්ෂය යටතේ වන "04. අදාළ ආයතනික හා නෛතික රාමුව" සම්බන්ධයෙන් පහත පරිදි;

04. අදාළ ආයතනික හා නෛතික රාමුව

| *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|
| 1. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය<br>2. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br>3. ජනතා වතු සංවර්ධන මණ්ඩලය<br>4. සීමාසහිත ලංකා පොස්පේට් සමාගම<br>5. වී අලෙවි මණ්ඩලය<br>6. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය<br>7. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව | • කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත (1999 අංක 20)<br>• වී අලෙවි මණ්ඩල පනත (1971 අංක 14)<br>• ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතන පනත (1972 අංක 5)<br>• කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්තිය සඳහා වන ශ්‍රී ලංකා සභාව පනත (1987 අංක 47) |

(9) එම නිවේදනයෙහි අංක "15.1 වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය" ශීර්ෂය හා ඒ යටතේ වන "01. කාර්යයන් හා කර්තව්‍යයන්, 02. සුවිශේෂී ප්‍රමුඛතා සහ 03. අදාළ ආයතනික හා නෛතික රාමුව" ඉවත් කිරීමෙන්;

(10) එම නිවේදනයෙහි අංක "15.2 කාබනික හා ස්වභාවික පොහොර නිෂ්පාදන, සැපයුම් හා නියාමන රාජ්‍ය රාජ්‍ය අමාත්‍ය"ශීර්ෂය හා ඒ යටතේ වන "01. කාර්යයන් හා කර්තව්‍යයන්, 02. සුවිශේෂී ප්‍රමුඛතා සහ 03. අදාළ ආයතනික හා නෛතික රාමුව" ඉවත් කිරීමෙන්;

(11) එම නිවේදනයෙහි අංක "15.0 කෘෂිකර්ම අමාත්‍ය" ශීර්ෂයට පසු පහත නව ශීර්ෂය හා ඒ යටතේ වන "01. කාර්යයන් හා කර්තව්‍යයන්, 02. සුවිශේෂී ප්‍රමුඛතා සහ 03. අදාළ ආයතනික හා නෛතික රාමුව'' ඇතුලත් කිරීමෙන්;

15.1 කාබනික පොහොර නිෂ්පාදන ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය

01. කාර්යයන් හා කර්තව්‍යයන්

කෘෂිකර්ම අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "ප්‍රමිතියෙන් යුතු පරිසර හිතකාමී කාබනික පොහොර භාවිතය දිරි ගැන්වීම සඳහා සහ උසස් තාක්ෂණික කෘෂිකර්මාන්තයක්"ඇතිකිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව කාබනික පොහොර නිෂ්පාදන, ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම විෂයපථයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

02. සුවිශේෂී ප්‍රමුඛතා

1. වී හා ධාන්‍ය වර්ග ගම්මිරිස්, කරබු නැටි, කොකෝවා ඇතුළු ප්‍රධාන භෝග මෙන්ම එළවළු, පළතුරු හා ගෙවතු වගා සඳහා තාක්ෂණික වගා ක්‍රමයන්, උසස් බීජ හා පැළෑටි මෙන්ම නියමිත ප්‍රමිතියෙන් යුත් පරිසර හිතකාමී කාබනික පොහොර නිසි කලට බෙදා හැරීම සඳහා ක්‍රමවේද සැකසීම
2. දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් අන්තර්ජාතික ප්‍රමිතියට අනුගතව පරිසර හිතකාමී කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සහ උසස් මට්ටමේ පොහොර වර්ග ද රට තුළම නිෂ්පාදනය කිරීම දිරි ගැන්වීම
3. දේශීය ගොවියා සහ පාරිභෝගිකයා සෑහීමකට පත්වන ආකාරයේ සාධාරණ මිළ ප්‍රතිපත්තියක් සහ භෝග විවිධාංගීකරණ වැඩපිළිවෙලක් අදාළ ආයතන සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම
4. කාබනික පොහොර භාවිතය හා වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
5. කාබනික එළවළු හා පලතුරු පරිභෝජනය ගෘහ මට්ටමෙන් පුළුල් කිරීම සඳහා සමෘද්ධි හා අඩු ආදායම්ලාභී ගෙවතු වගා කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම

6. වියළි මිරිස්, බඩ ඉරිඟු, සෝයා, මුං හා කව්පි, ළූණු සහ අල වැනි භෝග නිෂ්පාදනය වැඩි කිරීම මගින් එම නිෂ්පාදන ආනයන අවම කිරීම
7. අතිරික්ත නිෂ්පාදනය ගබඩා කිරීම සහ අගය එකතු කිරීමෙන් අපනයනය සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම
8. කෘෂි නිෂ්පාදන අගය එකතු කර අපනයනය කිරීම සඳහා කෘෂි අස්වනු එක්රැස් කිරීමේ සහ සැකසීමේ මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම
9. එළවළු, පළතුරු ආශ්‍රිත අපනයන නිෂ්පාදන කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම
10. ජාත්‍යන්තර මට්ටමේ ගුණාත්මක බීජ නිෂ්පාදනය සඳහා දේශීය බීජ ප්‍රතිපත්තියක් හඳුන්වා දීම
11. ආනයන බීජවල ප්‍රමිතිය තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පිළිගත් ප්‍රමිති සහතික තුළ එම ආනයනයන් සිදු කිරීම නියාමනය කිරීම
12. ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා පෞද්ගලික අංශය දිරිමත් කිරීම
13. ආවේණික ප්‍රවේණි ගුණයෙන් යුතු සහ ලෙඩ රෝගවලට හා දේශගුණික වෙනස්වීම් වලට ඔරොත්තු දෙන, අධි ඵලදා බීජ, පැළ වර්ග හඳුන්වා දීම
14. රජයේ ගොවිපොළවල් හා බීජ නිෂ්පාදන ගොවිපොළ සංවර්ධනය
15. නව තාක්ෂණික ක්‍රමවේදයන් තුළ භූ ජලය, බිම් සකස් කිරීම, බීජ හා පැලෑටි තෝරා ගැනීම, පොහොර යෙදීම, පෙර හා පසු අස්වනු හා සම්බන්ධයෙන් ප්‍රාදේශීය මට්ටමෙන් පූර්ණ අධ්‍යයනයන් සිදු කොට ගොවීන් ඒ පිළිබඳව දැනුවත් කිරිමට කටයුතු කිරීම
16. තාක්ෂණික කෘෂිකර්මාන්තයක් වෙත යොමු වීම සඳහා අවශ්‍ය දැනුම, තාක්ෂණික උපකරණ, ඉඩම් භාවිතය, මූල්‍ය දායකත්වය මගින් වෙළඳපළ වටිනාකම් එකතු කළ කාර්මික නිෂ්පාදන සඳහා යොමු කිරීම
17. අස්වනු නෙළීමේදීත්, ප්‍රවාහනයේදීත්, ගොඩබෑමේදීත් සිදුවන අපතේ යාම වළක්වා ගැනීම සඳහා නව තාක්ෂණ ක්‍රම භාවිතයෙන් රාජ්‍ය සහ පෞද්ගලික අංශය ඒකාබද්ධ කර වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම
18. ජලය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම මගින් වැඩි අස්වනු ලැබෙන ක්‍රමවේදයන් හඳුන්වා දීම මගින් ජල පරිභෝජනයේ ආර්ථික ප්‍රතිලාභ උපරිම කිරීම

03. අදාළ ආයතනික හා නෛතික රාමුව

| *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|
| 1. ජාතික පොහොර ලේකම් කාර්යාලය<br>2. සීමාසහිත ලංකා පොහොර සමාගම<br>3. කොළඹ කොමර්ෂල් පොහොර සමාගම<br>4. ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය (ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය)<br>5. ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන<br>6. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව<br>7. ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය | • පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත (1980 අංක 33)<br>• පැලෑටි ආරක්ෂා කිරීමේ පනත (1999 අංක 35)<br>• පොහොර විධිමත් කිරීමේ පනත (1988 අංක 68)<br>• ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර පනත (1973 අංක 18)<br>• ග්‍රාමෝදය මණ්ඩල පනත (1982 අංක 28)<br>• ගොවිජන සංවර්ධන පනත (2000 අංක 46)<br>• ගස් හෙළීම (පාලන කිරීම) පනත (1951 අංක 9)<br>• බීජ වී පනත (2003 අංක 22)<br>• පස් සංරක්ෂණ පනත (1996 අංක 24) |

(12) එම නිවේදනයෙහි අංක "15.1 කාබනික පොහොර නිෂ්පාදන ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය" ශීර්ෂයේ සිට නැවත අංකගත කිරීමෙන්;

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.